# පොළොන්නරු යුගයේ රචිත පාලි කාව්‍යවිචාරය (සුබෝධාලංකාරය) පිළිබඳ අධ්‍යයනයක්

# A Study on the Pali Poetical Critiscim (Subodhālaṃkāra) in Polonnaruwa Peiod

ආචාර්ය ඇහැලේපොල මහින්ද හිමි

## Abstract

Subodhālaṃkara is the only Poetic criticism document of Pāli Literature composed by Ven. Saṅgarakkhita thera who lived in the Polonnaruwa period, was a great pupil of Ven. Dimbulāgala Kassapa saṅgarāja thera and Galaturumulavasi Seela thera. In addition, during the same period, Ven. Saṅgarakkhita wrote numerous Pāli books, as following. The most important ones are Vuttodaya, Susaddhasiddhi, Saṃbandacintā, Yogavinicchaya, and Khuddakasikkhā tīkā. During the Polonnaruwa period, he was not only an influential Buddhist monk but also a highly educated Pāli Grammarian and Sub Commentator. Ven. Mahānāma compiled all of Sri Lanka's ancient history in Mahawaṃsa (The Great Chronicle), and Nikāya Saṅgrahaya attested to his enormous literary contributions to Pāli literature. In addition, there are unacceptable ideologies regarding the due time period of Ven. Saṅgarakkhita was lived among the Pāli scholars. Although there is common sense, He lived at the end of the Polonnaruwa period but Prof. G.P. Malalasekara states that he lived in the Dambadeniya Period. It is more difficult to find the Pāli Poetic criticism forgetting the Sanskrit Poetic criticism history. Hence, The Kawyādarśa was the primary source for composing The Subodhālaṃkāra. However many

scholars emphasized that the Subodhālaṃkāra is not a verbal translation of Kawyādarśa. What are the formal details for presenting on Ven. Saṅgarakkhita's Subodhālaṃkāra in Polonnaruwa period? This is the research question of this paper. The research objectives of are to open and investigate the rare Pāli and Buddhist studies factors of the Polonnaruwa period, especially Pāli Poetic criticisms. The Study is based on the Content analysis method and it uses primary and secondary sources for analysis.

**Keywords**: Polonnaruwa, Subodhālaṃkāra, Histoty, Ven. Saṅgarakkhita, Pāli.

**හැඳින්වීම**

පොළොන්නරුව රාජධානිය යනු ශ්‍රී ලංකාවේ රාජධානි නිරිතදිගට සංක්‍රමණයවීමේ දී එහි දෙවැනි රාජධානිය යි. භාෂාධ්‍යයනෙහිලා මෙම යුගය සංස්කෘත හා සිංහල සාහිත්‍යය පෝෂණය සඳහා ඉවහල් වූ අතර පාලි සාහිත්‍යය විෂයෙහි ලා ද සුවිශේෂී කාලපරිච්ඡේදයක් වශයෙන් සැලකේ. පාලි ටීකා සාහිත්‍යය ආරම්භ වී සංවර්ධනය වීම සහ වුත්තෝදය සුබෝධාලංකාරය වැනි පාලි කාව්‍යවිචාරත්මක කෘති බිහි වීම ඒ අතර ප්‍රමුඛ ය. පාලි සාහිත්‍යයෙහි ඇති එක ම කාව්‍යාලංකාර විචාර කෘතිය සුබෝධාලංකාරය යි. මෙය පාලි කාව්‍ය අලංකාර සම්ප්‍රදාය සුපෝෂණය කළ ප්‍රාමාණික සහ සුවිශේෂී ග්‍රන්ථය වශයෙන් ද සැලකේ. භාරතීය කාව්‍යවිචාරවාදයෙහි ඉතිහාසය නොවිමසා හා නොසලකා පාලි කාව්‍යවිචාරයක ඉතිහාසය ගවේෂණය කිරීම අශාස්ත්‍රීය ප්‍රයත්නයකි. පාලි කාව්‍යවිචාරවාදයෙහි අග්‍රස්ථානය හොබවන සුබෝධාලංකාරය සංස්කෘත කාව්‍යවිචාරයෙහි ප්‍රමුඛස්ථානය නියෝජනය කරන දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය ඇසුරින් රචනා කරන ලද බව පොදු නිගමනය යි. සුබෝධාලංකාරයෙහි ආරම්භයෙහි දී ම රාමශර්මන් ආදි සංස්කෘත අලංකාරිකයන් සිහිපත් කිරීම මෙයට කදිම නිදසුනකි. ඒ බව පහත දැක්වේ.

''රාමසම්මාද්‍ය'ලඞකාරා - සන්ති සන්තො පුරාතනා
තථා'පිතු වලඤ්ජනෙති - සුද්ධමාගධිකා න තෙ'',
(සුබෝධාලංකාරය, 2009: 88)

පාලි සුබෝධාලංකාරය රචනා කිරීමේ දී දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයේ එළිය සංඝරක්ඛිත හිමියන් විසින් ප්‍රබල ලෙස ලබා ගත් බව කාහට වුවද වහා අවබෝධ වේ. (ධම්මානන්ද හිමි, 2007: 75-83) සංස්කෘත අලංකාරිකයන් අතර ජනප්‍රිය භාමහ, දණ්ඩී, වාමන ආදීන් පිළිබඳ මුලින් ම සඳහන් නොකරන සංඝරක්ඛිත හිමියෝ ''රාමශර්මන්'' නමැති කවියෙකු පිළිබඳ ව වෙසෙසින් දක්වයි. අනතුරුව සුබෝධාලංකාරය සඳහා පූර්වාදර්ශ සැපයූ කාව්‍යාදර්ශය පිළිබඳ ව මෙන්ම පෙර විසූ සංස්කෘත කාව්‍යාලංකාර ග්‍රන්ථයන් ද සිහිපත් කරයි. උන්වහන්සේගේ නාමය සංඝරක්ඛිත හිමි වන බව ග්‍රන්ථාවසානයේ සහ සෑම පරිච්ඡේදයක ම අවසානයේ එන පාඨවලින් පැහැදිලි වේ. ''ඉති සංඝරක්ඛිතයතින්‍දො විරචිතෙ සුබොධාලඞකාරෙ දොසා'වබොධ නාම පඨමො පරිච්ඡෙදො'', (සුබෝධාලංකාරය, 2009, 56, 61, 65, 80, 83). සුබෝධාලංකාර කතුවරයා පැරණි සංස්කෘත කාව්‍යවිචාර ග්‍රන්ථයන් පූර්වාදර්ශ කොට ගත්ත ද ඒවා සමීප ව ඇසුරු කළ ද බෞද්ධ සම්ප්‍රදායට උචිත කාව්‍යවිචාර කලාවක් නිර්මාණය කිරීම උදෙසා ශුද්ධමාගධී බසින් කාව්‍යාලංකාර හැදෑරීමට රුචියක් ඇත්තවුන්ගේ ප්‍රයෝජනය පිණිස මෙය රචනා කර ඇත.

තෙනා'පි නාම තොසෙය්‍ය - මෙතෙ ලඞකාරවජ ජිතෙ
අනුරූපෙනා'ලඞකාරෙ - නෙසමෙසො පරිස සමො,
(සුබෝධාලංකාරය, 2009: 90)

සංස්කෘත සම්ප්‍රදායෙහි මෙන් ලෞකික සෞන්දර්යාත්මක කාව්‍ය සංකල්පවලට අදාළ ව කාව්‍යවිචාර සිද්ධාන්ත ඉදිරිපත් කිරීමට පාලි සම්ප්‍රදාය මුල් කාලීනව ඉදිරිපත් වී නැත. සංස්කෘත නොදත් අයගේ ප්‍රයෝජනය පිණිස සියබස්ලකර වැනි සිංහල කෘතීන් ද බිහි වූ නිසා පාලියෙන් ද අලංකාර කාව්‍යවිචාර ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව තවදුරටත් ශක්තිමත් වන්නට ඇත.

**පර්යේෂණ ගැටලුව**

සංඝරක්ඛිත මාහිමියන්ගේ සුබෝධාලංකාරය පාලි අලංකාර කාව්‍යවිචාරයෙහිලා සංරචිත එක ම සාරගර්භ කෘතිය වේ. පොළොන්නරු යුගයේ රචිත මෙම පාලි අලංකාර කාව්‍යවිචාර කෘතිය පිළිබඳ විධිමත් මූලාශ්‍රය ඇසුරින් ශාස්ත්‍රීය ව අධ්‍යයන සිදුකරන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව යි.

**පර්යේෂණ අරමුණු**

සුබෝධාලංකාරය පොළොන්නරු යුගය හැඩ කළ කෘතියකි. එය පාලි අලංකාර කාව්‍යවිචාරයෙහිලා ඇති එක ම සහ ප්‍රමුඛත ම මූලාශ්‍රයය වන අතර ඒ පිළිබඳ ව කාව්‍යවිචාරාත්මක දෘෂ්ටිකෝණයකින් තදනුබද්ධ විරල තොරතුරු අධ්‍යයනය කිරීම මෙහි අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය පදනම් කරගෙන සුබෝධාලංකාරය, වුත්තෝදය, කාව්‍යාදර්ශය ආදි පාලි සංස්කෘත ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් ද විමර්ශනය කරමින් ගුණාත්මක පර්යේෂණයක් සිදුකිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය යි.

**සාකච්ඡාව**

සංඝරක්ඛිත හිමියෝ පාලි සහ සංස්කෘත භාෂා පිළිබඳ ව භාෂාන්තර වියතෙක් මෙන්ම ඡන්දෝලංකාර පිළිබඳ ව විශේෂඥයෙක් ද විය. උන්වහන්සේ 'සම්බන්ධචින්තා' නම් ග්‍රන්ථයෙහි සමාප්තියෙහි දී තමන් විසින් වුත්තෝදය, සුසද්දසිද්ධි, යෝග විනිච්ඡය, සුබෝධාලංකාරය සහ ඛුද්දකසික්ඛා ටීකා යන ග්‍රන්ථ කරන ලදැයි ප්‍රකාශ කරති (මලලසේකර, 1965: 147). ඛුද්දකසික්ඛා ටීකාව සුමංගලපසාදනී යනුවෙන් ද හැඳින්වේ. ('ඛුද්දක සික්ඛාය ටීකාපි සුමංගලපසාදනී', බුද්ධදත්ත හිමි, 2008:

275) සංඝරක්ඛිත හිමියන්ගේ පාලි ග්‍රන්ථ අතර අග්‍රස්ථානය වුත්තොදයට හිමි වේ. එය පාලි ඡන්දස් ශාස්ත්‍රය ගැන ඇති එක ම සහ ප්‍රථම ග්‍රන්ථය යි. (බුද්ධදත්ත හිමි, 2008: 275) මේ විස්තරය සම්බන්ධචින්තාවෙහි පහත අයුරින් දැක්වේ.

සුසද්දසිද්ධිං යො යොග - නිච්ඡයං සබ්භිවණ්ණිතං
අකාසුබොධාලංකාරං - වුත්තොදයමනාකුලං
සංඝරක්ඛිතනාමෙන - සාසනොදයකාරිනා
බුද්දසික්ඛාය ටීකා ච - තථා සම්බන්ධචින්තනං
ධීමතා මහාථෙරෙන - තෙනෙව සාධු රචිතා, (ධම්මිස්සර හිමි, 1916, 02)

උන්වහන්සේගේ සම්බන්ධචින්තාව, මොග්ගල්ලාන සම්ප්‍රදායට අයත් පාලි ක්‍රියාපද සම්බන්ධ නීති මාලාවකි. සුසද්දසිද්ධි යනු මොග්ගල්ලාන පඤ්චිකාවට කළ ටීකාව යි. මෙය සාරත්ථවිලාසිනිය නමින් ද හැඳින්වේ. ඛුද්දකසික්ඛා ටීකාව උන්වහන්සේගේ අවසාන ග්‍රන්ථය යි. මේ අනුව සංඝරක්ඛිත තෙරණුවෝ භාෂාන්තර වියතෙක්, ඡන්දෝලංකාර පිළිබඳ ව විශේෂඥයෙක්, පාලි ව්‍යාකරණඥයෙක් සහ ටීකාචාර්යවරයෙක් වශයෙන් ද හඳුන්වාදීම සුදුසු ය. මෙහි කර්තෘවර සංඝරක්ඛිත මහාස්වාමීන්ගේ ජීවන තොරතුරු පොළොන්නරු යුගය හා සම්බන්ධ බැවින් මෙය එම යුගයේ දී සම්පාදිත බව පිළිගනී. (වුත්තාලංකාරය, 2021: 02) ශ්‍රී සංඝරක්ඛිත මහාස්වාමිපාදයන් වහන්සේ ඒකශ්‍රැතියෙන් නෛකග්‍රන්ථසහස්‍රධාරණ සාමර්ථ්‍ය ඇති දසමහා පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා අතුරෙහි ප්‍රධාන මහාස්ථවිරතුමෙකු බව දේවරක්ඛිත මාහිමියන්ගේ නිකායසංග්‍රහයෙහි දැක්වේ. එසේම මුන්වහන්සේ දායෝපතිස්ස රජුගේ මුණුබුරු කෙනෙක් බව ද ගලතුරුමූල විහාර සංඝයා වහන්සේලා අතර ප්‍රධානත්වය ගෙන වැඩසිටිය බව ද මහාවංසයෙහි දැක්වේ. (ධම්මිස්සර හිමි, 1916: 02) මුන්වහන්සේ පොළොන්නරුවේ රජ පැමිණි මහාපරාක්‍රමබාහු රජ සමයෙහි දිඹුලාගල විහාරාධිවාසි වූ කීර්තිමත් ටීකාචාර්යයන් වහන්සේ නමක් වූ දිඹුලාගල මහාකාශ්‍යප සංඝරාජ තෙරුන්ගේ ශිෂ්‍යයෙකු බව පහත පද්‍යයෙහි දැක්වේ.

සාරිපුත්තං මහාසාමිං - නෙකසත්‍ථවිසාරදං
මහාගුණං මහාපඤ්ඤං - නමෙ මෙ සිරසා ගරුං,
(බුද්ධදත්ත හිමි, 2008: 275)

එසේම තමන් වහන්සේ එකල ගලතුරුමුල විහාරවාසී සීල නම් මහාස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යයෙකු බව උන්වහන්සේගේ ම කෘතියක් වන බව වුත්තෝදයෙහි අවසන සඳහන් කර ඇත.

සෙලන්තරායතන වාසික සීලථෙර
පාදො ගුරු ගුණගුරු ජයතමමමෙසො
යසසප්පභාවමවලම්බමයෙසිසොපි
සම්පාදිතො'භිමතසිද්ධිකරොපරත්‍ථො
(වුත්තොදය, 1916: 08)

එමෙන්ම වුත්තෝදය හා සුබෝධාලංකාරය දොළොස්වන (12) ශත වර්ෂයේ අපරභාගයට අයත් වන අතර යුග වශයෙන් ගත් කළ දඹදෙණි යුගයට අයත් බව තවත් මතයකි. සිංහල සාහිත්‍යයේ පමණක් නොව පාලි සකු භාෂා පිළිබඳ ව මහත් දියුණුවක් ඇති කළ යුගයක් ලෙස ද මෙම යුගය කැපී පෙනෙයි. (මලලසේකර, 1965: 53).

**සුබෝධාලංකාරය**


සුබෝධාලංකාරය පාලි භාෂාවෙන් රසභාව පරිමිත රමණීය කාව්‍යයක් රචනය කිරීමට කාව්‍ය සිද්ධාන්ත සම්පාදනය කිරීමට කළ කෘතියකි. මෙහි පරිච්ඡේද පහ (05) කි. ගාථා තුන්සිය හැට හතකි. (367) මෙහි එන පරිච්ඡේද නම්,

1. දෝසාවබෝධ
2. දෝසපරිහාරාවබෝධ
3. ගුණාවබෝධ
4. අත්‍ථාලංකාරාවබෝධ
5. රසභාවාවබෝධ

සුබෝධාලංකාරයෙහි උක්ත පරිච්ඡේද ව්‍යූහය තුළින් සංඝරක්ඛිත හිමි සංස්කෘත කාව්‍යවිචාර සිද්ධාන්ත ඇසුරු කරමින්

එම සාහිත්‍යය තුළ ප්‍රකට ව සාකච්ඡා වූ කාව්‍යවිචාර සිද්ධාන්ත කෙරෙහි ද අවධානය යොමු කර ඇති බව පැහැදිලි ය. එසේ වුවද බෞද්ධ කාව්‍යයක් රචනා කිරීමේ දී මෙන්ම එම කාව්‍යයක ප්‍රාමාණිකත්වය, දාර්ශනික සිද්ධාන්තවලට එකඟ වෙමින් ඇගයීමේ දී පාලියට ම ආවේණික වන ස්වාධීන ස්වතන්ත්‍ර න්‍යායයක් හඳුන්වාදීමට සංඝරක්ඛිත හිමියන් විසින් දරනු ලබන තැතක් සුබෝධාලංකරයෙහි විද්‍යමාන වේ (ධම්මානන්ද හිමි, 2007: 75 -83). කාව්‍යකරණයේ දී කවියා තුළ තිබිය යුතු අංග ලක්ෂණ මෙන්ම කාව්‍යවිචාරයේ දී විචාරකයා සතුව විය යුතු අංග ලක්ෂණාදිය ද සුබෝධාලංකාරයෙහි විද්‍යමාන ය. මේ අනුව පෙනීයන්නේ සුබෝධාලංකාර කතුවරයා 1. ගුණ-දොස 2. අලංකාර 3. රසභාව යන කරුණු තුන උසස් කාව්‍යයක් රචනා කිරීමේ දී මූලික ව බලපාන බව විශ්වාස කළ බවයි (ධම්මානන්ද හිමි, 2007: 75 -83). උක්ත ගුණ-දොස, අලංකාර, රස-භාව යන සංකල්ප මත පිහිටා පාලි සම්ප්‍රදායෙහි කාව්‍යවිචාරය විකාශය වන බව අවධාරණය වේ.

පළමු දෝසාවබෝධ පරිච්ඡේදයෙන් කාව්‍ය දෝෂ පිළිබඳ ව පුළුල් විග්‍රහයක් ඉදිරිපත් වේ. කාව්‍යයක් සතු විය යුතු සඵලවත් බව, උසස් බව සහ ගුණාත්මක බවට හානි කරන මෙවලම වන්නේ කාව්‍යය දෝෂය යි. සුබෝධාලංකාරයෙහි ප්‍රධාන වශයෙන් ම කාව්‍ය දෝෂ පිළිබඳ ව සුවිශේෂී අවධානයක් යොමු කරන අතර ඒ අනුව කාව්‍ය දෝෂ ප්‍රභේද තුනක් (03) දක්වයි.




ආදි වශයෙන් සුබෝධාලංකාරය කාව්‍ය දෝෂ විසිතුනක් (23) ඉදිරිපත් කර ඇත. සංස්කෘත කාව්‍යවිචාරකයන් ද කාව්‍ය

දෝෂ බහුලව විස්තර කර ඇත. විශ්වනාථ පද, පදාංශ, වාක්‍ය, අර්ථ, රස වශයෙන් කාව්‍ය දෝෂ ප්‍රභේද පහක් (05) දක්වා ඇත. සංස්කෘත කාව්‍යවිචාරකයන් අතුරින් කාව්‍ය දෝෂ පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කළේ භාමහ ය (ධම්මානන්ද හිමි, 2007: 75 -83). ඔහු තම කාව්‍යාලංකාරයේ ප්‍රථම පරිච්ඡේදයෙහි ස්ථාන දෙකක දෝෂ දහයක් ද (10) දෙවන පරිච්ඡේදයෙහි මෙධාවි නමැති පඬිවරයෙකු විසින් පෙන්වා දෙන ලද කාව්‍ය දෝෂ හතක් ද (07) හතර හා පස්වන පරිච්ඡේදයේ දී තවත් කාව්‍ය දෝෂ එකොළහක් ද (11) වශයෙන් කාව්‍ය දෝෂ විසි අටක් (28) පිළිබඳ ව සඳහන් කර ඇත.

සංඝරක්ඛිත හිමියෝ කාව්‍යයක උසස් බව හා ගුණාත්මක බව සුරකින මෙවලම වශයෙන් හඳුන්වන්නේ කාව්‍ය දෝෂයන්ගෙන් විනිර්මුක්ත වීම ය. රන්රිදී මුතුමැණික් දියමන්ති පබළු ආදි ආභරණයෙන් සැරසුණු කාන්තාවකගේ ශරීරයෙහි ලප-කැළැල් ආදිය තිබේ නම් ඇය නෙත් සිත් පැහැර ගන්නා ලස්සනකින් අනූන යැයි පැවසිය නොහැකිය. සංඝරක්ඛිත හිමි මෙම අපූර්ව නිදසුන මඟින් ගුණ අලංකාර දෙකෙන් යුතු වුවත් එහෙත් ස්වල්ප දෝෂවලින් යුක්ත වූ කාව්‍ය එබඳු වූ (අබරණ ඇතිමුත් දොස් ඇති) කන්‍යාවක මෙන් පැසසිය යුතු නොවේයැයි දක්වා ඇත.

ගුණාලඞකාර සංයුත්තා - අපි දොසලව'ඞකිතා
පාසංසියා න විඤ්ඤූහි - සාකඤ්ඤා විය තාදිසී,
(සුබෝධාලංකාරය, 2009: 52)

දෝෂ සහිත ව බඳනා ලද කාව්‍යය කවියන්ගේ මෝඩකම ප්‍රකාශ කරන්නක් වේ. ගුණ අලංකාරයෙන්ගෙන් යුක්ත වුවත් එහි යම් දෝෂයක් ඇත්නම් එය පණ්ඩිතයන්ගේ ප්‍රශංසාවට ලක් නොවේ. මෙලෙස සංස්කෘත කාව්‍යවිචාරයෙහි දී ද අවධානයට ලක් වී ඇති කාව්‍ය දෝෂයන්ගෙන් තොර වූ කාව්‍යයක් උසස් කාව්‍යයක් ලෙස සැලකීමට සංඝරක්ඛිත හිමියෝ ද උත්සුක වූහ. කාව්‍යයේ දෝෂ පිළිබඳ උන්වහන්සේගේ තෙවදෑරුම් විග්‍රහය පහතින් දැක්වේ.

**පද දෝෂ**

කිසියම් කාව්‍යයක පදයක් තුළ පවතින දෝෂය පද දෝෂ නම් වේ. එවැනි පද දෝෂ අට (08) කි.

1. විරුද්ධත්‍ථන්තර දෝෂ
2. අධිකත්‍ථ දෝෂ
3. කිලිට්ඨ දෝෂ
4. විරොධි දෝෂ
5. නෙය්‍ය දෝෂ
6. විසේසනාපෙක්‍ඛ දෝෂ
7. හීනත්‍ථක දෝෂ
8. අනත්‍ථක (නිරත්‍ථක) දෝෂ, (සුබෝධාලංකාරය, 2009: 52)

**වාක්‍ය දෝෂ**

කවියා නිර්මාණය කරන වාක්‍යයක දක්නට ඇති දෝෂ, වාක්‍ය දෝෂ නම් වේ. එවැනි දෝෂ නවයකි (09).

1. එකත්‍ථ දෝෂ
2. භග්ගරීති දෝෂ
3. බ්‍යාකිණ්ණ දෝෂ
4. ගම්ම දෝෂ
5. යතිහීන දෝෂ
6. කමච්චුත දෝෂ
7. අතිවුත්ත දෝෂ
8. අපෙතත්‍ථ දෝෂ
9. බන්‍ධඵරුස දෝෂ , (සුබෝධාලංකාරය, 2009: 52)

**අර්ථ දෝෂ**

කාව්‍යයක පවතින අර්ථමය දෝෂ හයකි (06 කි).

1. අපක්කම දෝෂ
2. ඖචිත්‍යහීන දෝෂ
3. භග්ගරීති දෝෂ
4. සංසය දෝෂ
5. ගම්ම දෝෂ
6. දුට්ඨාලංකාර දෝෂ

(සුබෝධාලංකාරය, 2009: 128)

සුබෝධාලංකාරයේ දෙවැනි පරිච්ඡේදය දෝසපරිහාර අවබෝධ නම් වේ. පළමු පරිච්ඡේදයෙන් දැක් වූ දෝෂ අතහැර නිවැරැදි ව කාව්‍යයක් රචනා කිරීමට අදාළ උපදෙස් එහි ඇතුළත් ය. උක්ත පද දෝෂ, අර්ථ දෝෂ සහ වාක්‍ය දෝෂයන්ගෙන් තොරව පද්‍යයක් රචනා කිරීම සංඝරක්ඛිත හිමියන් ඉතා උසස් කොට සලකා ඇත. කාව්‍ය දෝෂ දුරලීම මහත් උත්සාහයෙන් කළ යුතු බවත් එවිට සියලු ආකාරයෙන් දෝෂවලින් විනිර්මුක්ත වූ ශබ්ද සහ අර්ථ දෙදෙනාගේ නිර්දෝෂීභාවය ප්‍රකට වන බවත් උන්වහන්සේගේ අදහස යි. එවිට ගුණ සහිත කාව්‍යයක් නිමැවේ. ඒ බව මෙසේ දැක් වේ.

තෙන දොසනිරාසොච - මහුස්සාහෙන සාධියො
නිද්දොසා සබ්බථාසා'යං - සගුණා න භවෙය්‍ය කිං,

(සුබෝධාලංකාරය, 2009: 130)

මේ අනුව කාව්‍යයෙහි ශබ්ද සහ අර්ථවල නිදොස් බව උසස් වූ කාව්‍ය ගුණයක් බව පාලි කාව්‍යවිචාරවාදය අවධාරණය කොට ඇත. සුබෝධාලංකාරයෙහි පරිච්ඡේදකරණයෙහි ප්‍රමුඛ අවධානයක් ඒ පිළිබඳ ව යොමු කර ඇති බව ද පැහැදිලිය.

උසස් බෞද්ධ කාව්‍යයක දිශානතිය පිළිබිඹු කරවන ලක්ෂණ සහිත තෙවැනි පරිච්ඡේදය ගුණාවබෝධය යි. කාව්‍ය ගුණ සංස්කෘත කාව්‍යවිචාර මාර්ගයෙහි චිරප්‍රසිද්ධ කාව්‍යවිචාර ධාරාවකි. එබැවින් සුබෝධාලංකාර කතුවරයා කාව්‍ය ගුණ

දැක්වීමේ දී සංස්කෘත කාව්‍යවිචාර මාර්ගය සමීපව ඇසුරු කර ඇති බව පෙනේ. සංස්කෘත කාව්‍යවිචාර මාර්ගයෙහි දී ගුණ සහ රීති දෙක එක ම සමවාය වශයෙන් බැඳී පවතින බව දැක්වේ. රීතීන් නිපදවන්නා වූ සාධක නම් ගුණයැයි පැවසිය හැකි වේ (ඤාණරතන හිමි, 2015: 239-265). රීතිය යනු විශේෂත්වයක් දරන්නා වූ පද සමූහයක් බව ද ඒ විශේෂතාව ''ගුණය'' ආත්මකොට ඇති බව භාමහ පඬිවරයා දක්වයි (ඤාණරතන හිමි, 2015: 239-265). භරතමුනි නාට්‍යශාස්ත්‍රයෙහි දී ''ගුණ'' යන්න පළමුවරට ඉදිරිපත් කර ඇති අතර එහිදී ඔහු කාව්‍ය ගුණ දහයක් (10) දක්වා ඇත (ඤාණරතන හිමි, 2015: 239-265). දණ්ඩීන් කාව්‍ය ගුණ ''ප්‍රාණ'' යනුවෙන් හඳුන්වා දෙයි. කාව්‍ය ශෝභාව ඇති කරන්නා වූ හෙවත් උපදවන්නා වූ ධර්ම කාව්‍ය ගුණ යනුවෙන් හැඳින්වේ (ඤාණරතන හිමි, 2015: 239-265). කාව්‍ය ගුණ සහ රීතීන් අතර අන්‍යොන්‍ය සමවායක් ඇති බව ද ප්‍රකට වේ. සුබෝධාලංකාර කතුවරයා කාව්‍ය ගුණ ඉදිරිපත් කිරීමේදී දරන්නේ භාමහගේ මතයට සමාන මතයකි. භාමහ ප්‍රසාද, මාධූර්‍ය, ඕජො යන මේවා ගුණ යන නමින් නොහඳුන්වා ඒවා කාව්‍යයක අවශ්‍යයෙන් ම තිබිය යුතු ''ධර්මතා'' ලෙස පෙන්වා දී තිබේ (ඤාණරතන හිමි, 2015: 239-265). සංස්කෘත කාව්‍යවිචාරයේ කාව්‍ය ගුණ පිළිබඳ විග්‍රහය මෙසේ ගොනු කර දැක්විය හැකිය.

| කාව්‍යවිචාරකයා | කාව්‍යවිචාර කෘතිය | කාව්‍යගුණ ප්‍රමාණය |
|---|---|---|
| භරතමුනි | නාට්‍යශාස්ත්‍රය | කාව්‍යගුණ 10 |
| දණ්ඩී | කාව්‍යාදර්ශය | කාව්‍ය ප්‍රාණ 10 |
| භාමහ | කාව්‍යාලංකාරය | කාව්‍ය ධර්මතා 03 |
| විශ්වනාථ | සාහිත්‍යදර්පණය | කාව්‍ය ගුණ 03 (මාධූර්ය, ඕජ, ප්‍රසාද) |
| ආනන්දවර්ධන | ධ්වන්‍යාලෝකය | කාව්‍ය ගුණ 03 (මාධූර්ය, ඕජ, ප්‍රසාද) |

සුබෝධාලංකාරය ද රීති භේදය නොසලකා දෝෂයන්ගෙන් තොරව කාව්‍යයේ ශෝභාව වර්ධනය කරවන කාව්‍ය ගුණ දහයක් (10) දක්වා ඇත. ඒවා මෙසේ ය.

1. පසාද 6. සීලෙස

2. ඔජ 7. උදාරතා

3. මධුරතා 8. කන්ති

4. සමතා 9. අත්‍ථබ්‍යත්ති

5. සුකුමාලතා 10. සමාධි, (සුබෝධාලංකාරය, 2009: 62)

දණ්ඩීන් කාව්‍යාදර්ශයෙහි දැක්වූ කාව්‍ය ගුණ දහය (10) සලකාගෙන සංඝරක්ඛිත හිමියන් ද සුබෝධාලංකාරයෙහි කාව්‍ය ගුණ සකසාගෙන ඇති බව පෙනේ. එහෙත් එම කාව්‍ය ගුණවලට අදාළ උදාහරණ ඉදිරිපත් කිරීමේ දී කාව්‍යාදර්ශයෙහි දැක්වෙන උදාහරණ වෙනුවට සමහර තැනක පාලි සම්ප්‍රදායට ගැළපෙන පරිදි බුද්ධ චරිතයට අදාළ නොයෙක් වර්ණනා ඇතුළත් කිරීමට සුබෝධාලංකාර කතුවරයා පෙළඹී ඇත. එසේ පෙළඹී ඇත්තේ පාලියට ගැළපෙන කාව්‍යවිචාර මාවතක් හඳුන්වා දීම සඳහා විය හැකිය.

සිව්වැනි පරිච්ඡේදය අර්ථාලංකාරාවබෝධය සඳහා වෙන් වී ඇත. අලංකාර පිළිබඳ ව සුබෝධාලංකාරය දරණ මතවාදය දණ්ඩීන්ගේ මතය සමග පරස්පර නොවන්නකි. ශබ්දාලංකාර හා අර්ථාලංකාර යනුවෙන් අලංකාර දෙයාකර වන අතර සුබෝධාලංකාරයෙහි අර්ථාලංකාරයට ප්‍රමුඛත්වයක් ලැබී ඇත. බුදුදහම අර්ථයට මූලිකත්වයක් දීම ඒ සඳහා බලපාන්නට ඇතැයි සිතිය හැකිය (ධම්මානන්ද හිමි, 2007: 75-83). අර්ථාලංකාරය නැවත ස්වභාවෝක්තිය සහ වක්‍රොක්තිය වශයෙන් දෙයාකාර වේ. වස්තුවක සැබෑ ස්වරූපය දැක්වීමෙන් ලබන චමත්කාරය ස්වභාවෝක්තිය වන අතර සුබෝධාලංකාර කතුවරයා මුලින් ම ස්වභාවෝක්තිය දක්වා ඇත. සංස්කෘත කාව්‍යවිචාරකයන් අතර

භාමහ ස්වභාවෝක්තිය අලංකාරයක් වශයෙන් නොපිළිගත් අතර වක්‍රොක්තියෙන් තොරව අලංකාරයක් තිබිය නොහැකි බව ද සඳහන් කරයි (ධම්මානන්ද හිමි, 2007: 75 -83). ඒ අතර දණ්ඩීන් ස්වභාවෝක්තිය සහ වක්‍රෝක්තිය යන දෙක ම පිළිගත්තේය. සුබෝධාලංකාරය ද දණ්ඩීන් අනුව යමින් ස්වභාවෝක්තිය සහ වක්‍රෝක්තිය යන දෙක ම පිළිගෙන ඇත. (ධම්මානන්ද හිමි, 2007: 75 -83). සුබෝධාලංකාරය භාමහගේ මතය නොසලකා දණ්ඩීන්ගේ මතය අනුගමනය කර ඇති බව මෙයින් පැහැදිලි වේ.

සංඝරක්ඛිත හිමි ශබ්දාලංකාරවල දැක්වෙන අනුප්‍රාස, යමක, වක්‍රෝක්ති, භාෂාසම, ශ්ලේෂ, චිත්‍ර යන ශබ්දාලංකාරයන් නොසලකා අර්ථාලංකාර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ස්වභාවෝක්තිය සහ වක්‍රෝක්තිය යන අර්ථාලංකාර දෙක ප්‍රධාන කොට සලකා ඇත. වක්‍රෝක්තිය යනු වාච්‍යාර්ථය ඉක්මවා ගිය අවස්ථාව යි. ඒ අනුව වක්‍රෝක්ති අලංකාරයට අයත් වන උපමා රූපක ආදි සියලු අලංකාර ප්‍රභේද මෙම සිව්වැනි පරිච්ඡේදයෙහි ඇතුළත් කර තිබේ. වක්‍රෝක්තියට අයත් වන අලංකාර ප්‍රභේද තිස් පහකි (35) (සුබෝධාලංකාරය, 2009:5, 6, 7, 8).

මේවා විග්‍රහ කිරීමේ දී පෙනීයන්නේ දණ්ඩීන් දැක්වූ අලංකාර තිස්පහක් (35) වෙනුවට සුබෝධාලංකාරයෙහි අලංකාර තිස්හයක් (36) ඉදිරිපත් කරයි (පියරතන හිමි, 2015:345-357). කාව්‍යාදර්ශයෙහි නොදැක්වෙන සුබෝධාලංකාරයෙහි දැක්වෙන අතිරේක අලංකාරය ''එකාවලී'' නම් වේ.

උත්තරං උත්තරං යත්‍ථ - පුබ්බපුබ්බවිසෙසනං
සියා එකාවලී සා'යං - ද්විධා විධි නිසෙධනා,
(සුබෝධාලංකාරය, 2009:399)

තව ද කාව්‍යාදර්ශයෙහි දැක්වෙන උත්ප්‍රේක්ෂා අලංකාරය සුබෝධාලංකාරයෙහි ''පරිකප්පනා'' යනුවෙන් සඳහන් වේ. උක්ත වක්ක්‍රොක්තියේ අලංකාර තිස්පහ (35) අතර ''භාවාලංකාරය'' ප්‍රධාන වන බව සුබෝධාලංකාරය දක්වයි. භාවාලංකාරය කාව්‍යයේ ජීවිතය වේ. කවීන්ගේ අදහස් ප්‍රකාශ

කරන්නා වූ වර්ණනාත්මක පද සමූහය ''භාව'' නම් වන අතර කාව්‍යයේ ආරම්භයේ සිට අවසානය තෙක් පවතින බැවින් එය කාව්‍යයේ ජීවය වන බව සුබෝධාලංකාරය දක්වයි. මේ සඳහා දණ්ඩීන්ගේ ''භාවිකත්‍වමිති ප්‍රහුඃ - ප්‍රබන්ධ විෂයං ගුණඃ'' කවියාගේ අභිප්‍රාය හෙවත් බලාපොරොත්තුව භාව වන අතර එය කාව්‍යයක චමත්කාර ගුණ විශේෂය වේ යන අදහස අනුව සකස් වුවක් විය හැකිය. මෙය මූලික කොට සැලකීම බෞද්ධ කාව්‍යවිචාරයට සුදුසුම ය (ධම්මානන්ද හිමි, 2007: 75 -83). වර්ණනා කළ යුතු වස්තුව පිළිබඳ විය හැකි ප්‍රමාණය ඉක්මවා වර්ණනා කිරීම අතිශයෝක්ති වන අතර ඒ සඳහා සුබෝධාලංකාරයෙහි එන නිදසුන සුබෝධාලංකාර කතුවරයා පාලි සම්ප්‍රදායට අනුකූල කාව්‍යවිචාර මාර්ගයක් සම්පාදනය කිරීමට දැරූ ප්‍රයත්නයෙහි පිළිබිඹුවක් වැන්න.

පිබන්ති දෙහකන්තියෙ - නෙත්ත'ඤ්ජලිපුටෙන තෙ
නා'ලං ගන්තුං ජිනෙසං - තණ්හං තණහාහරෝ'පි කිං,
(සුබෝධාලංකාරය, 2009:278)

'බුදුරජාණන් වහන්ස, ඔබවහන්සේගේ ශරීර කාන්තිය යම් සත්පුරුෂයෙක් නෙත් නමැති අඤ්ජලි පුටයෙන් බොත් ද ඒ සත්පුරුෂයන්ගේ තෘෂ්ණාව වළක්වන්නට තෘෂ්ණාව නැසුවා වූ ඔබ වහන්සේ අසමර්ථ සේක් ද' (සත්පුරුෂ ජනයන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති කරගෙන සිටින ඇල්ම දුරු කරන්නට බුදුරජාණන් වහන්සේ අසමත් ද යන්න මෙයින් කියැවේ.) සුබෝධාලංකාරකරුවා සංස්කෘත කාව්‍යවිචාර ග්‍රන්ථ සමීප ව ඇසුරු කළ ද ඒ සඳහා ලබා දෙන උදාහරණ පාලි සම්ප්‍රදායට සම්බන්ධ දෑ දැක්වීමට නිරන්තරයෙන් ම උත්සාහ දැරූ බව පෙනේ. සංස්කෘත කාව්‍යවිචාරයෙහි සෙවණ ලැබුව ද පාලි කාව්‍යවිචාර චින්තාව හැකි පමණකින් හෝ ස්වාධීන හා අනන්‍ය ලක්ෂණයන්ගෙන් බැබළවීම සඳහා සංඝරක්ඛිත හිමියන් සුබෝධාලංකාරයෙහි අර්ථාලංකාරාවබෝධ පරිච්ඡේදයෙන් ගෙන ඇති ප්‍රයත්නය පැසසිය යුතු ය.

සුබෝධාලංකාරයේ අවසාන පරිච්ඡේදය රසභාවාබෝධ වන අතර එය රසවාදය පිළිබඳ ව විවරණ ඉදිරිපත් කරයි. රස සංකල්පය භාරතීය කාව්‍යවිචාරයෙහි දීර්ඝ කලක් තිස්සේ විකාශය වූ කාව්‍යවිචාර සිද්ධාන්තයකි. එහි ආදිකර්තෘවරයා නාට්‍යශාස්ත්‍රය රචනා කළ භරතමුනිවරයා ය. භරතමුනිවරයා රස අටක් (08) දැක්වූ අතර දණ්ඩීන් ද ඊට අනුගතව ඇත. පසුකාලීනව ''ශම'' නම් ස්ථායිභාවයක් පදනම් කරගෙන උපදනා ''ශාන්ත'' නම් රසයක් සමග භාරතීය කාව්‍යවිචාරයෙහි රස ගණන නවයක් (09) විය (ඤාණරතන හිමි, 2015: 239-265). ප්‍රේයස්, වාත්සල්‍ය, ප්‍රීති, ස්නේහ, භක්ති, ශ්‍රද්ධා, ලෞල්‍ය යනාදි නොයෙක් රසයන් පසුකාලීනව භාරතීය රස සංකල්පයට එකතු වූ බැවින් රසවාදය කලින්කල දියුණු වී මුලින් ගණනින් අටක් (08) වුවද කල්යත් ම එහි සංඛ්‍යාව පසළොසකට (15) වඩා අධික විය. රසවාදය සංස්කෘත කාව්‍යවිචාර මාවතෙහි ඉතා පුළුල් වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවකි. ක්‍රි.ව. 09 සියවසේ ආනන්දවර්ධන, රසවාදය පදනම් කර ගනිමින් ධ්වනිවාදය එළිදැක්වීය. මෙයට අමතරව උද්භට, රුද්‍රට, භට්ටලොල්ලට, ශ්‍රී ශඞ්කුක, මහිමභට්ට, අභිනවගුප්ත, ජගන්නාථ යන කවීහු ද රසවාදය පිළිබඳ ව පුළුල් වශයෙන් සාකච්ඡා කළහ (ඤාණරතන හිමි, 2015: 239-265). සුබෝධාලංකාරකරු ද උක්ත සම්ප්‍රදාය පිළිගනිමින් මුල් කාලීනව රසවාදයට එකතු වූ ''ශාන්ත'' රසය සමග පාලියෙහි ද රස සංඛ්‍යාව නවයක් (09) බව දක්වා ඇත්තේ මෙසේය.

සිඞගාර-හස ස-කරුණ-රුද්ද-වීර-භයානකා
බීභච්ඡ'බ්භුත-සන්තා ච-රසට්ඨායීනනුක්කමා,
(සුබෝධාලංකාරය, 2009: 81)

ශාංගාර, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස, අද්භූත, ශාන්ත යන මෙම රස නවය සංස්කෘත සම්ප්‍රදාය ඇසුරින් ම සකස් වූවකි. රස සංකල්පයෙහි ලා භරතමුනිවරයාගේ රස සූත්‍රයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඔහු රස සංකල්පය ඉදිරිපත් කරන්නේ එය නාට්‍යයට සම්බන්ධ ධර්මතාවක් වශයෙනි. රසයෙන් තොර වූ කිසිදු කාව්‍යාර්ථයක් නොමැති බව එතුමා

දක්වයි. සුබෝධාලංකාරයෙහි රස සංකල්පය කාව්‍යාදර්ශය නො ඉක්මවයි. ඒ අනුව මෙහි, ස්ථායීභාව, විභාව හා ව්‍යභිචාරීභාවයන්ගේ සම්බන්ධයෙන් රස ජනනය වන අයුරු දක්වයි. මෙය භරතමුනිවරයා දැක්වූ ''විභාවානුභාවව්‍යභිචාරී සංයෝගාත් රසනිෂ්පත්තිඃ'' සමග සැසඳේ (ධම්මානන්ද හිමි, 2007ඃ 75 -83). විභාව, අනුභාව ව්‍යභිචාරීභාවයන්ගේ මාර්ගයෙන් රස විඥාන තත්වයට ගෙන එනු ලබන ස්ථායීභාවය රස නම් වේ. සෑම පුද්ගලයෙකුගේ ම සිතෙහි පවත්නා ස්ථාවර භාව අටක් (08) වේ. ඒවා ස්ථායීභාව නමින් හැඳින්වේ. සංඝරක්ඛිත හිමි සුබෝධාලංකාරයෙහි දී ද මෙය විග්‍රහ කර ඇත.

ඨායීසම බන්‍ධිනො භාවා - විභාවා සානුභාවකා
සමපජ ජනති නිබද්ධා තෙ - රසස්සාදාය සාධුනං,
(සුබෝධාලංකාරය, 2009ඃ 81)

යම් පුද්ගලයෙකුගේ සිතෙහි හටගන්නා වූ ස්ථාවර භාවයන් ස්ථායීභාව නම් වේ. භරතමුනි කාව්‍යයේ අර්ථය මතුවන්නේ භාවයන් (කාව්‍යාර්ථාන් භාවයන්තීති භාවාඃ) මඟින් බව දක්වා ඇත. දෘශ්‍ය කාව්‍යයේ අර්ථය නම් රසය යි. රසය නමැති අර්ථය ඉස්මතු කරන්නේ යම්කින් ද එය භාව නම් වේ. භාව යනු සිතුවිලි මාත්‍රයකි. විභාව, අනුභාව, ව්‍යභිචාරීභාව යන අවස්ථාවල දී සිදුවන්නේ භාව නමැති ප්‍රකෘති චෛතසිකය විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වීම යි (ධම්මානන්ද හිමි, 2007ඃ 75 -83). කාව්‍යයේ අර්ථය හෙවත් රසය ප්‍රකට වන්නේ භාවයන්හි එකිනෙකට වෙනස් ක්‍රියාකාරීත්වය හේතුවෙනි. විභාව යනු කිසියම් හැඟීමක් ඉපදවීමට අරමුණු වන දෙය යි. එය ආලම්භන විභාව සහ උද්දීපනවිභාව යනුවෙන් දෙයාකාර ය. කිසියම් හැඟීමක් ඉපදවීමට කිසියම් අරමුණක්, ආලම්බනයක් තිබිය යුතු ය. නාට්‍යයක ප්‍රේක්ෂකයාත් කාව්‍යයක පාඨකයාත් ප්‍රකාශනයක ශ්‍රාවකයාත් රචකයාගේ ප්‍රධාන අරමුණ යි. (ධනුද්දරගේ ප්‍රේමයට ආලම්බන වූයේ මනමේ කුමරිය යි) සිතෙහි හටගන්නා හැඟීම් දියුණු කිරීමට හේතු වන පරිසරය උද්දීපන විභාව වේ. උයන, සඳරැස්, මද පවන, දේදුන්න යනාදිය රචකයාගේ නිර්මාණාත්මක

හැඟීම් වැඩිදියුණු කිරීමට සමත් වන පරිසරයන් ය (ධම්මානන්ද හිමි, 2007: 75 -83). භය, ශෝක යනාදිය නිසා ශාරීරිකව සිදුවන වෙනස්කම් ''අනුභාව'' නම් වේ. බියට පත්වූවෙකුගේ මුහුණ තැති ගනී. ශෝකයට පත්වුවකුගේ දෙනෙතින් කඳුළු සැලේ. මෙලෙස සිතෙහි හටගන්නා හැඟීම් ප්‍රකට කරවන ශාරීරික විකෘතිතා අනුභාව නම් වේ. ''ව්‍යභිචාරීභාව'' නම් ප්‍රධාන හැඟීම් සමග පවත්නා වූ සහ එය උද්දීපනය කිරීමට යටත් වන්නා වූ දේවල් ය (ඤාණරතන හිමි, 2015: 239-265). එහිදී ව්‍යභිචාරීභාව තිස්තුනක් (33) දණ්ඩීන් දන්වන අතර සුබෝධාලංකාරය ද එය එසේ ම දක්වා ඇත (සුබෝධාලංකාරය, 2009: 81).

මීට අමතරව රති, හාස, ශෝක, ක්‍රොධ, උත්සාහ, භය, ජුගුප්සා, විස්මය යන භාවයන්ගෙන් පෝෂිත වූ ශාංගාරාදිය කාව්‍ය රස බව භරතමුනිවරයා පෙන්වා දී ඇත. සුබෝධාලංකාරය ද මේ ස්ථායීභාවන්ට පසුකාලීනව එකතු වූ ශාන්ත රසය හා එහි ස්ථායීභාවයන් පිළිගෙන ඇත (ඤාණරතන හිමි, 2015: 239-265). ස්ථායීභාවයන් තුළින් (ස්ථාවරභාව) රසය ජනනය වීම සඳහා සාත්වික භාවයන් අට දෙනෙක් (08) ඉවහල් වන බව ද සුබෝධාලංකාරයෙහි දැක්වේ.

1. ථමභ　　5. අසසු

2. පලය　　6. වෙපථු

3. රොම　　7. වෙවණ්ණිය

4. සෙද　　8. විසසරතා (සුබෝධාලංකාරය, 2009: 81)

රති ආදි භාව තමන්ට අදාළ ශෘංගාර ආදියෙහි පිහිටි කල්හි ඒවා ස්ථායිභාව වේ. ශෘංගාර රසයෙහි ස්ථායීභාව රතිය යි. විභාවානුභාවදීන්ගේ විධිමත් වූ සංයෝගය නිසා පුද්ගලයෙකු තුළ පවතින්නා වූ ස්ථායීභාව පහත දැක්වෙන පරිදි රස බවට පත් වේ.

| ස්ථායිභාවය | රසය |
|---|---|
| 1. රති | ශෘංගාරය |
| 2. හාස | හාස්‍යය |
| 3. ශෝක | කරුණ |
| 4. ක්‍රෝධ | රෞද්‍ර |
| 5. උත්සහ | වීර |
| 6. භය | භයානක |
| 7. ජුගුප්සා | බීභත්ස |
| 8. විශ්මය | අද්භූත |
| 9. ශම | ශාන්ත |

නාට්‍යකරණයෙහි ලා, රචිත භාරතීය කාව්‍යවිචාරයෙහි ආදිතම කෘතිය වන භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයෙහි හය වැනි (06) පරිචය සම්පූර්ණයෙන් ම රසවාද විවරණය සඳහා වෙන් කොට ඇත. සංඝරක්ඛිත හිමියන් ද සුබෝධාලංකාරයෙහි අවසාන පරිචය (05) රසභාවාවබෝධ යනුවෙන් නම් කර වෙන් කොට තිබේ. භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයෙහි රසවාද සිද්ධාන්ත අනුව පාලි සුබෝධාලංකාරයෙහි රස සංකල්පය ගොඩනගා ඇති අයුරු මැනවින් දැක ගත හැකිය (ඤාණරතන හිමි, 2015: 239-265). රම්‍ය වූ ප්‍රදේශය, සීතාදී කාලය, රම්‍ය වූ ගීතනාටකාදී කලාව, වස්ත්‍රාභරණ, ගන්ධමාලාදි වේශය ආදි ශබ්දයෙන් දැක්වූ ඔවුන්ගේ දර්ශන ස්පර්ශ ආදි නැවත නැවත යෙදීම නිසා ඔවුනොවුන් කෙරෙහි අනුරක්ත වූ තරුණ තරුණී දෙදෙනාගේ අභිරමණ ප්‍රීතිය රතිය යැයි කවියන් කියන ලදි (සුබෝධාලංකාරය, 2009: 326) විකාර වූ ආකාරාදි විභාවයන් හේතුකොට ගෙන

තමාගේ හෝ අනුන්ගේ කීම ''හාස'' සංඛ්‍යාත ස්ථායීභාවය යි. නින්දා, ශ්‍රම, ආලස්‍ය ආදි ව්‍යභිචාරීභාවයන් හේතුකොටගෙන පෝෂණය ඇති කල්හි ම හාස්‍ය රසය වන්නේය. ඒ හාස්‍ය රසය බොහෝසෙයින් ස්ත්‍රී ආදීන්ට වන්නේය (සුබෝධාලංකාරය, 2009: 438). කරුණාවට හේතුවන යමකුගේ මරණය වැනි දෙයින් හද තුළ ඇතිවන ආවේග සංඛ්‍යාත භාවය ක්‍රෝධය යි. ධීරවීර නායකයෙකුගේ චමත්කාරාතිශය උපදවන බැවින් අන්‍ය රසයන්ට වඩා උත්කෘෂ්ඨ වූ රසය වීර රසය යි. යමෙකුගේ වීරවික්‍රම ක්‍රියා උදෙසා සිතේ ඇති වන භාවය බිය යි. ලේ, කුණු, මළ, මූත්‍ර, සැරව, දුගඳ ආදිය හේතුවෙන් ඇතිවන පිළිකුල ජුගුප්සා නම් වේ. විශ්මය උපදවන ආශ්චර්යමත් ලෝකාතිශය පදාර්ථ නිසා හටගන්නා වූ රසය අද්භූත රසය යි. මෛත්‍රිය කරුණාව දයාව ප්‍රීතිය ආදි හේතුකොටගෙන ඇතිවන කායික චෛතසික උපසම සංඛ්‍යාත ස්ථායීභාවය, උසස් පුද්ගලයන් විසින් සේවනය කරන ලද ශාන්ත රසය (සුබෝධාලංකාරය, 2009: 447) නම් වන්නේය. ශාන්ත රසය ඇති වන්නේ මෛත්‍රී කරුණා දී ගුණ හේතු කොටගෙන ය. සුබෝධාලංකාරයෙහි ප්‍රධාන වශයෙන් ම සාකච්ඡා කරන්නේ යථෝක්ත මෛත්‍රිය කරුණාව දයාව ප්‍රීතිය වැනි සංකල්පයන් ය. අනෙක් සියලු විවරණ අප්‍රධාන වේ. එහිලා දක්නට ඇති විශේෂත්වය වන්නේ භාරතීය සාහිත්‍ය විචාර මූලධර්ම හා සංකල්ප මිශ්‍ර කර ගනිමින් බෞද්ධ සාහිත්‍යවිචාර සංකල්ප සංකීර්ණ නොකිරීම යි (ධම්මානන්ද හිමි, 2007: 75 -83). සංඝරක්ඛිත හිමියන් සාහිත්‍යය රසය මෙන් ම බෞද්ධ දර්ශනය මැනවින් වටහාගත් භික්ෂුවක් හැටියට එම ක්ෂේත්‍ර දෙකෙහි ම ගැඹුරට හානි නොවන පරිදි සුබෝධාලංකාරය රචනා කිරීම පැසසිය යුතු ය (ධම්මානන්ද හිමි, 2007: 75 -83).

**නිගමනය**

පොළොන්නරුවේ සිටි කීර්තිමත් අග්‍රගණ්‍ය පාලි භාෂා හා සාහිත්‍යධරයෙක් වූ ශ්‍රී සංඝරක්ඛිත හිමියන්ගේ සුබෝධාලංකාරය බෞද්ධ කාව්‍යවිචාර සම්ප්‍රදායෙහි විද්‍යමාන පැරණිතම සහ එක ම කාව්‍යාලංකාර කෘතිය යි. ආරම්භයේදී ම සංඝරක්ඛිත

හිමියන් රාමශර්මන් වැනි පැරණි සංස්කෘත අලංකාරිකයන්ගේ නාමයන් සහ දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය ආදිය සිහිපත් කළ ද මෙහි මුඛ්‍ය අරමුණ වූයේ සංස්කෘත මිශ්‍ර අලංකාර වර්ජනය කරන ශුද්ධ මාගධිකයන් සඳහා ශුද්ධ මාගධි හෙවත් අමිශ්‍ර පාලියෙන් පාලි අලංකාර ග්‍රන්ථයක් රචනා කිරීම යි. සංස්කෘත කාව්‍යාලංකාර ආදි කාව්‍යවිචාර සිද්ධාන්තයන්ගේ ආදර්ශවලින් සැකසුණු ද සුබෝධාලංකාරය පාලියට ආවේණික කාව්‍යාලංකාර හා කාව්‍යවිචාර සම්ප්‍රදායක් බෞද්ධ සාහිත්‍ය විචාර ක්ෂේත්‍රයෙහි සංස්ථාපිත කිරීමට ශ්‍රී සංඝරක්ඛිත හිමියන් යත්න දරා ඇති බව පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*කාව්‍යශේඛරය*, (1963), (සංස්.), පඤ්ඤාලෝක හිමි, හඳපාන්ගල, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

*කාව්‍යාදර්ශය*, (2001), (සංස්.), සෝරත හිමි, වැලිවිටියේ, මරදානː සමයවර්ධන පොත්හල.

*ධ්වන්‍යාලෝකය*, (1969), (සංස්.), සේනානායක, ජී.එස්.බී., නුගේගොඩː අනුලා මුද්‍රණාලය.

*වුත්තොදය*, (1916), (සංස්.), ධම්මිස්සර හිමි, උදම්මිට, රත්දොඹ.

*සුබෝධාලංකාරය*, (2009), (සංස්.), ගුණානන්ද හිමි, ගන්තලාවේ, මරදානː සමයවර්ධන පොත්හල.

*සුබෝධාලංකාරය*, (1947), (සංස්.), ලංකානන්ද හිමි, ලබුගම, ලංකානන්ද ව්‍යාඛ්‍යාව. මරදානː සමයවර්ධන පොත්හල.

### ද්විතීයික මූලාශ්‍රය

ඥාණවංශ හිමි, ගල්පොතුගොඩ, (2021), *වුත්තාලංකාරය*, කොළඹ.

තිලකසිරි, ජයදේව (1971). *වෛදික සාහිත්‍යය*. කොළඹː ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තිලකසිරි, ජයදේව (2007). (දෙවන මුද්‍රණය). *සංස්කෘත කාව්‍ය සාහිත්‍යය*. කොළඹː ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, විමල් (2010). *නව විචාර සංකල්පනා*. කොළඹ: විසිදුණු ප්‍රකාශන.

නාරම්පනාව, කීර්ති (2003). *භාරතීය කාව්‍යවිචාරය*. බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (1998). *භරතමුනි විරචිත නාට්‍යශාස්ත්‍රය*. මරදාන: සමයවර්ධන පොත්හල.

පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ (2012). (දෙවන මුද්‍රණය), *කාව්‍යවිචාරය සහ රසවාදය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පියතිස්ස හිමි, දෙනගම (2015). *කාව්‍ය රසය හා භාෂාව*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පියරතන හිමි, වෑගම (2006). *සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය*. දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

ප්‍රඥාකීර්ති හිමි, කොටහේනේ (1946). *සාහිත්‍යය හා සමාජය*. කැළණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (1998), *පාලි සාහිත්‍යය*, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

මලලසේකර, ගුණපාල, (1965), *ලංකා පාලි සාහිත්‍යය*, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මහානාම හිමි, බඹරැන්දේ (1981). *කාව්‍යවිචාර දර්ශන*. කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම.

විජයවර්ධන, හේමපාල, ජී. (2014). (අභිනව මුද්‍රණය), *කාව්‍යවිචාර ගවේෂණ*. කොළඹ: ෆාස්ට් පබ්ලිකේෂන්.

විජයවර්ධන, හේමපාල, ජී. (2003). *සංස්කෘත කාව්‍යවිචාර මූලධර්ම*. බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

Coomaraswamy, Ananda, K. (1939). *Some Pali Words, Harvard Journal of Asiatic Studies. Vol. 04*, No.02. USA: Harvard-Yenching Institute.

Dhadphale, M.G. (1975). *Some Aspects of Buddhist Literary Criticism, as Pāli Sourses*. India: Adreesh Prakashan.

Kane, P. V. (1961). *History of Sanskrit Poetics*. New Delhi: Motilal Banaras's Publishers Pvt.

Keith, Bridle (1947). *Classical Sanskrit Literature*. California: YMCA Publishing Nonce.

MacDonald, Arthur, Antony (1990). *A History of Sanskrit Literature*.

New Delhi: Motilal Banaras's Publishers Pvt.

Muller, Max (1926). *Ancient Sanskrit Literature*. India: Oxford IBH Puplishing.

Raghavan, V. (1961). *Some Concepts of the Alankara Sastra*. New Delhi: India.

## අනෙකුත් මූලාශ්‍රය

ඤාණරතන හිමි, පුස්සැල්ලෑවේ (2015). 'භාරතීය කාව්‍යවිචාරය හා සුබෝධාලංකාරය.' පල්ලේවත්තේ ධම්මරතන හිමි, සූරියපොකුණ අමිතගවේෂි හිමි (සංස්.) *නැණස*. අස්ගිරිය: මහාවිහාර මහාපිරිවෙණ.

ගල්මන්ගොඩ, සුමනපාල (1993). 'භාෂාව, සත්‍යය හා යථාර්ථය - ථෙරවාද මතය.' අත්තුඩාවේ පියරතන හිමි ප්‍රමුඛ පිරිස (සංස්.) *අත්තුඩාවේ ශ්‍රී රාහුල අනුනාහිමි අභිනන්දනය*. කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම.

ගුණසේන, දේශප්‍රිය (2011). 'පාලි කාව්‍යවිචාර මූලධර්ම කෙරෙහි සංස්කෘතයේ ආභාසය', වැලිවිට සෝරත හිමි (සංස්.) *අනුදීපනා*. පුවක්පිටිය: මාගධී ප්‍රකාශන.

පියරතන හිමි, වෑගම, (2015), 'සුබෝධාලංකාරයෙහි පැනෙන සංස්කෘත ආභාසය හා ස්වාධීනත්වය', *නැණස*, (සංස්.) පල්ලේවත්තේ ධම්මරතන හිමි, සූරියපොකුණ අමිතගවේෂි හිමි, මහාවිහාර මහ පිරිවෙණ, අස්ගිරිය.

ධම්මානන්ද හිමි, මකුරුප්පේ (2001). 'කාව්‍යවිචාරය හා රසාස්වාදය පිළිබඳ බෞද්ධ න්‍යාය.' චන්ද්‍රතිලක බුලත්සිංහල (සංස්.) *නිවන්මග - 32 වැනි කලාපය*. කොළඹ: රජයේ මුද්‍රණාලීය බෞද්ධ සංගමය.